කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2016/2017

# PSC 3142 - රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලනය

කාලය: පැ දෙකයි (02)

ප්‍රශ්න **තුනකට** (03) පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

01. රාජ්‍ය ප්‍රතිපත්ති බලාත්මක කිරීම හෝ සාක්ෂාත් කරගැනීම අරමුණු කරගත් සියළු ම ක්‍රියාකාරකම්වලින් රාජ්‍ය පරිපාලනය සමන්විත වේ. - එල්. ඩී වයිට් ඉහත ප්‍රකාශය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

02. පහත සඳහන් ඒවා අතර සම්බන්ධතාව විවේචනාත්මකව විභාග කරන්න.
    (අ) නීති සම්පාදනය සහ බලතල බෙදීම
    (ආ) නීති සම්පාදනය සහ ව්‍යවස්ථා විවරණය

03. "සමාජයේ විවිධත්වයන්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේදී විවිධාකාරයේ ප්‍රජාතාන්ත්‍රික ආකෘති භාවිතයට ගැනීම සඳහා නූතන ජාතික රාජ්‍යය පොළඹවා ඇත." ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

04. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට ආචාරධර්ම සම්බන්ධ කර ගැනීම අත්‍යවශ්‍ය වන්නා සේම අසීරු වන්නේ ඇයි? විභාග කරන්න.

05. ඒකීය හා සන්ධීය රාජ්‍යයන්හි රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය යෝග්‍ය උදාහරණ භාවිත කරමින් සන්සන්දනය කරන්න.

06. පහත සඳහන් ඕනෑ ම මාතෘකා **දෙකක්** (02) පිළිබඳ ව සටහන් ලියන්න:
    (අ) වුඩ්රෝ විල්සන්
    (ආ) ප්‍රතිපත්ති විද්‍යාව
    (ඇ) ශ්‍රී ලංකාවේ සන්ධීයවාදය පිළිබඳ ව පවතින විවාද
    (ඈ) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය සහ රාජ්‍ය ප්‍රතිපත්ති

*****************